# ශ්‍රී ලංකාවට නිදහස ලැබීම

# ශ්‍රී ලංකාවට නිදහස ලැබීම

## හැඳින්වීම

**මෙම ඒකකය මගින් සාකච්ඡා කරන්නේ,**

- 1948 සෝල්බරි ව්‍යවස්ථාව
- 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව
- 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව
- නිදහසින් පසු සංවර්ධන යෝජනා

## 1 - සෝල්බරි ප්‍රතිසංස්කරණ හා නිදහස ලැබීම

- රටේ අභ්‍යන්තර කටයුතු පිළිබඳ පූර්ණ බලතල ලැබෙන ආණ්ඩුක්‍රමයක් නිර්දේශ කිරීම
- ලංකාවේ ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණය 1947 දී පැවැත්වීමට කටයුතු යොදා තිබීම.
- D.S. සේනානායක මහතා එක්සත් ජාතික පක්ෂය පිහිටුවීම. (1946)
- ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණය 1947 පැවැත්වීම.
- නව අගමැති D.S. සේනානායක මහතා සමඟ ආරක්ෂක හා බාහිර කටයුතු පිළිබඳ ගිවිසුම් 2 අත්සන් කිරීම.

## සෝල්බරි ආණ්ඩුක්‍රමය - 1947

1947 මෙරටට හඳුන්වා දුන් ප්‍රථම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රජයේ කටයුතු කරගෙන යාම සඳහා ප්‍රධාන ආයතන 4 ක් හඳුන්වා දෙන ලදී.

- අග්‍රාණ්ඩුකාරවරයා
- අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය
- පාර්ලිමේන්තුව
- අධිකරණය

## ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය

පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පවතින සෑම රටකම දැකිය හැකි අනිවාර්ය ලක්ෂණයකි.

ද්වි පක්ෂ ක්‍රමය

බහු පක්ෂ ක්‍රමය

# 1956 මැතිවරණ හා සමාජ පෙරළිය

- 1956 මහ මැතිවරණය ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ විශේෂ සන්ධිස්ථානයකි.
- ශ්‍රී ලංකාව නිදහස ලද අවස්ථාවේ සිට ආණ්ඩු බලය මෙහෙය වූ එක්සත් ජාතික පක්ෂයට විරුද්ධ වූ දේශපාලන පක්ෂ හා ස්වාධීන මන්ත්‍රීවරුන් එක්ව මහජන එක්සත් පෙරමුණ නමින් දේශපාලන සංවිධානයක් පිහිටුවීම.

මෙම මැතිවරණය සඳහා තරඟ කිරීමට.

- ✓ S.W.R.D බණ්ඩාරනායක මහතාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
- ✓ පිලිප් ගුණවර්ධන මහතාගේ විප්ලවකාරී සමසමාජ පක්ෂය
- ✓ වීජයානන්ද දහනායක මහතාගේ භාෂා පෙරමුණ
- ✓ අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල මහතාගේ නායකත්වයෙන් ස්වාධීන අපේක්ෂකයන් එක්ව
- ✓ මහජන එක්සත් පෙරමුණ නමින් නව සන්ධානයක් පිහිටුවීම.

## 1972 ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වීම

1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවෙන් මෙරට පූර්ණ නිදහස් ජනරජයක් බවට පත්වීම.

1947 - 1972 - ලංකා
1972 සිට - ශ්‍රී ලංකා

## 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්‍ෂණ

- එතෙක් ලංකාව ලෙසින් හැඳින් වූ මෙරට 'ශ්‍රී ලංකා' නමින් හැඳින්වීම.
- බ්‍රිතාන්‍ය සමඟ පැවති බැඳීම් අවසන් වීම.
- ශ්‍රී ලංකාව ඒකීය ජනරජයක් බවට පත්වීම.
- මිනිස් මූලික අයිතීන් සුරක්ෂිත කිරීම.

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන වගන්තියේ මූලික මිනිස් අයිතිවාසිකම් ගැන සඳහන් වේ.

## 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ :

- ජනතාව විසින් තෝරා පත්කර ගන්නා මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවක් පැවතීම.
- ජනතාවගේ ඡන්දයෙන් විධායක ජනාධිපතිවරයෙකු පත් කිරීම.
- ජනතාවගේ අධිකරණ බලය ව්‍යවස්ථාව අනුව පිහිටුවා ඇති අධිකරණ පද්ධතියක් මගින් ක්‍රියාත්මක වීම.

## විධායක ජනාධිපති ධූරය

- මුළු රටම එක් ඡන්ද කොට්ඨාශයක් ලෙස සලකා මහජන ඡන්දයෙන් විධායක ජනාධිපති තෝරා පත්කර ගන්නා අතර තේරී පත්වන ජනාධිපතිවරයාට වසර 6 ක කාල සීමාවක් සඳහා එම ධුරයෙහි කටයුතු කිරීමට හැකියාව ඇත.

# පාර්ලිමේන්තුව

- 1972 සිට ජාතික රාජ්‍ය සභාව නමින් හැඳින්වූ ව්‍යවස්ථාදායකය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව ලෙස නම් කෙරුණි.

1978 පාර්ලිමේන්තුවේ සංයුතිය

මන්ත්‍රීන් 225

සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ 196

ජාතික ලැයිස්තු ක්‍රමය යටතේ 29

- පාර්ලිමේන්තුව සතු බලතල
  - නීති පැනවීම
  - මුදල් පරිපාලනය
  - අයවැය සකස් කිරීම
  - සංවර්ධන සැලසුම් සම්පාදනය

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ඡන්ද විමසීමේ ක්‍රම

ජනාධිපතිවරණය

සමානුපාතික නියෝජන ක්‍රමය

ජනමත විචාරණය

# ගොවි ජනපද පිහිටුවීම

- **වියළි කලාපයේ ගොවි ජනපද පිහිටුවීමේ අරමුණු :**

1. තෙත් කලාපයේ පැවති ජනගහන තදබදය හා රැකියා හිඟය අඩු කිරීම.
2. රටේ ආහාර නිෂ්පාදනය වැඩි කිරීම.
3. වියළි කලාපයේ පැරණි වැව් හා වාරි මාර්ග අලුත්වැඩියා කරමින් ඉඩම් ආර්ථික සංවර්ධනය
4. තෙත් කලාපයේ ඉඩම් හිඟය අඩුකොට තෘප්තිමත් ගොවි පරපුරක් නිර්මාණය

## මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය

මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඉදි වූ මහවැලි ව්‍යාපාර සඳහා ආධාර සැපයූ රටවල් :

- කොත්මලේ ජලාශය - ස්වීඩනය
- වික්ටෝරියා - බ්‍රිතාන්‍ය
- රන්දෙණිගල - බටහිර ජර්මනිය

**ආයාත ආදේශන ප්‍රතිපත්ති යනු :**

විදේශවලින් ආනයනය කරන භාණ්ඩ වෙනුවට ඊට සමාන ආදේශක දේශීය වශයෙන් නිෂ්පාදනය කර ගැනීමයි.

# මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ලක්ෂණ

- රජය පාසල් පිහිටුවීම හා අධ්‍යාපන ව්‍යප්තියට මුදල් යෙදවීම නිසා රට පුරා පාසල් සංඛ්‍යාව ඉහළ යාම.
- විෂයමාලා සංවර්ධනය හා ගුරු පුහුණු කටයුතු නවීකරණය.
- දිවා ආහාරය, පාසල් පොත්, වෛද්‍ය හා දන්ත වෛද්‍ය සේවා හා සුබ සාධන සේවා දියුණු කිරීම.
- 1942 දී ලංකා විශ්ව විද්‍යාලය කොළඹ පිහිටුවීම.
- 1952 දී ලංකා විශ්ව විද්‍යාලය පේරාදෙණියට ගෙනයාම.
- 1972 මොරටුව විශ්ව විද්‍යාලය පිහිටුවීම.
- 1974 දී යාපන විශ්ව විද්‍යාලය පිහිටුවීම.








# ශ්‍රී ලංකාවට නිදහස ලැබීම

1. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ පළමු මැතිවරණය පැවැත්වූයේ කුමන වසරේ ද?
2. ශ්‍රී ලංකාවේ ප්‍රථම,
   i). අගමැතිවරයා
   ii). විපක්ෂනායකවරයා කවු ද?
3. සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ප්‍රධාන අංග 03 ක් නම් කරන්න.
4. පහත සඳහන් දේශපාලන පක්ෂවල ආරම්භක නායකයන් කවුරුන් ද?
   A - එක්සත් ජාතික පක්ෂය
   B - ලංකා සමසමාජ පක්ෂය
   C - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
   D - කම්කරු පක්ෂය
   E - ෆෙඩරල් පක්ෂය
5. 1956 මහජන එක්සත් පෙරමුණ වටා එකතු වූ බලවේගය නම් කරන්න.
6. S.W.R.D බණ්ඩාරනායක මහතාගේ පාලන සමය තුළ හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ 04 ක් නම් කරන්න.
7. ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව හඳුන්වා දුන් වර්ෂය සඳහන් කරන්න.
8. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ 03 ක් සඳහන් කරන්න.
9. 1972 ආණ්ඩුක්‍රමය යටතේ හඳුන්වාදුන් අධිකරණ පද්ධතිය නම් කරන්න.
10. මෙරට ප්‍රථම විධායක ජනාධිපතිවරයා කවුරුන් ද?
11. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කැපී පෙනෙන අංග 03 ක් නම් කරන්න.
12. දෙවන ජනරජ ව්‍යවස්ථාවට අනුව විධායක ජනාධිපති සතු බලතල 04 ක් සඳහන් කරන්න.
13. 1978 ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව සතු බලතල 03 ක් ලියා දක්වන්න.

14. දෙවන ජනරජ ව්‍යවස්ථාවේ සඳහන් වන මූලික අයිතිවාසිකම් 03 ක් ලියන්න.
15. 1978 ව්‍යවස්ථාවේ සඳහන් ඡන්ද නියෝජන ක්‍රම 03 මොනවා ද?
16. මෙරට ගොවි ජනපද පිහිටුවීමේ ප්‍රධාන අරමුණු 03 ක් නම් කරන්න.
17. ගොවි ජනපද පිහිටුවීමේ දී රජය මුහුණදුන් අභියෝග 03 ක් සඳහන් කරන්න.
18. නිදහසට පෙර
    නිදහස ලැබීමෙන් පසු බිහි වූ ගොවි ජනපද ව්‍යාපාර 03 බැගින් නම් කරන්න.
19. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය මගින් අපේක්ෂා කළ අරමුණු 03 ක් නම් කරන්න.
20. A - කොත්මලේ
    B - වික්ටෝරියා
    C - රන්දෙණිගල ජලාශ ඉදිකිරීම සඳහා අනුග්‍රහය දැක්වූ විදේශ රටවල් මොනවාදැයි අනුපිළිවෙලින් දක්වන්න.
21. නිදහසින් පසු වී වගාවේ දියුණුවට අනුගමනය කළ ක්‍රියාමාර්ග 04 ක් ලියන්න.
22. මෙරට ව්‍යාපාරික කෘෂි කර්මාන්තයේ දියුණුව සඳහා නිදහසින් පසු ගත් ක්‍රියාමාර්ග 03 සඳහන් කරන්න.
23. මෙරට ප්‍රථම කාර්මික ජනපදය කුමක් ද?
24. මෙරට ආර්ථිකය නංවා සිටීමට ප්‍රථමයෙන් ආරම්භ කළ අපනයන සැකසුම් කලාප 03 සඳහන් කරන්න.
25. නිදහස් අධ්‍යාපනයේ පියා කවුරුන් ද?
26. නිදහසින් පසු මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ලක්ෂණ 04 ක් සඳහන් කරන්න.
27. නිදහසින් පසුව සමාජ සාධාරණත්වයක් ඇති කිරීමේ අරමුණින් ආර්ථික වශයෙන් දුබල කොටස් නංවා සිටීමට අනුමානය කළ වැඩසටහන් 03 ක් සඳහන් කරන්න.
28. නිදහසින් පසු ග්‍රාමීය සෞඛ්‍ය සේවා දියුණුවට ගත් ක්‍රියාමාර්ග සඳහන් කරන්න.